**ජාතික මාර්ග පද්ධතියේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය) - 2014**

---

ජාතික මාර්ග පද්ධතියේ ප්‍රධාන පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ (ප්‍රධාන පාලම් 37 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජපාන අන්තර්ජාතික සහයෝගීතා නියෝජිතායතනය අතර 2013 මාර්තු 14 දින එළඹි අංක එස්එල්-පී 108 දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම , අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ එවකට මහා මාර්ග, වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ විශ්ව විද්‍යාල අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ජාතික මාර්ග වල ප්‍රධාන පාලම් ඉදිකිරීම මඟින් ජාතික මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීම හා එමඟින් ආර්ථික සංවර්ධනයට දායක වීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ඇස්තමේන්තු මුළු පිරිවැය රු.මිලියන 27,249 කට සමාන ජපන්යෙන් මිලියන 16,132 ක් වූ අතර එයින් රු.මිලියන 20,913 කට සමාන ජපන් යෙන් මිලියන 12,381 ක් ජපාන අන්තර් ජාතික සහයෝගීතා නියෝජිතායතනය විසින් මූල්‍යායනය කිරීමට එකග වී ඇත. ඉතිරි ශේෂය වන රු. මිලියන 6,336 ක් ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යයනය කිරීමට එකග වී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 මාර්තු ආරම්භ කළ අතර 2019 අවසන් කිරීමට නියමිත විය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්

කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාල පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසනීයභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ ව්‍යාපෘතියේ වැඩිදියුණු කළ මූල්‍ය ප්‍රකාශන වල දක්වා ඇති වියදම් සතුටුදායක ලෙස සංසන්දනය කර ඇති බව,

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) ණය යටතේ කරන ලද ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදු කර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ, ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(උ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදය දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 2.2 ජේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගතවන ගැලපීම් වලින් ඇති වන බලපෑම් හැර මාගේ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී ඇති බවත්ය.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘති කටයුතුවලට සම්බන්ධයක් නොමැති කටයුතු වෙනුවෙන් දරන ලද රු.101,674 ක්, ව්‍යාපෘතියේ මෙහෙයුම් වියදම් ලෙස අයකර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලද රු.මිලියන 85 ක විශේෂ ණය මුදලක්, ශ්‍රී ලංකා රජයෙන් ලද අරමුදල් ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඇ) මාර්ග සංවර්ධන අධිකාරියේ විශේෂ ව්‍යාපෘති ඒකකය විසින් මෙහෙයවූ වෙනත් ව්‍යාපෘති 05 කට අදාල රු. මිලියන 38.80 ක් වූ පොදු කාර්ය වියදම්, ව්‍යාපෘතියේ මෙහෙයුම් වියදම් ලෙස අයකර තිබුණි.

(ඈ) මාර්ග සංවර්ධන අධිකාරියේ සේවා කාලයද ඇතුළත්ව සම්පූර්ණ සේවා කාලය සඳහාම වෙන් කිරීම් ගණනය කිරීම හේතුවෙන්, ව්‍යාපෘති කටයුතු සඳහා නිදහස් කරන ලද මාර්ග සංවර්ධන අධිකාරියේ සේවකයින් වෙනුවෙන් සිදු කළ රු. 835,192 ක් වූ පාරිතෝශිත සඳහා වෙන් කිරීම රු. 303,514 කින් වැඩියෙන් දක්වා තිබුණි.

### 2.2.2 නොසැසඳු ශේෂයන්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රේඛිය අමාත්‍යාංශයේ 2014 සඳහා විසර්ජන ගිණුමට අනුව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මුළු ප්‍රාග්ධන වියදම රු. මිලියන 45.90 ක් ලෙස දක්වා තිබුණි. කෙසේ වෙතත් ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල එය රු. මිලියන 46.10 ක් ලෙස දැක්වේ.

(ආ) ව්‍යාපෘතිය විසින් පාලම් 25 ක් යළි ඉදිකිරීමේ ව්‍යාපෘතිය ලෙස හඳුන්වන තවත් ව්‍යාපෘතියකට රු. මිලියන 1.95 ක් මාරු කර තිබුණද, එම ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල කිසිදු ශේෂයක් ගෙවිය යුතු ගිණුම් ලෙස දක්වා නොතිබුණි.

### 2.2.3 නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවීම්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2003 ජුනි 02 දිනැති මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ අංක පීඊඩී/12 චක්‍රලේඛයේ 8.3.9 වගන්තියේ උපදෙස් වලට පටහැනිව ව්‍යාපෘතිය විසින් 2014 දෙසැම්බර් 31 දක්වා පොදු කාර්ය වියදම් ලෙස රු. මිලියන 1.52 ක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ප්‍රේෂණය කර තිබුණි.

(ආ) 2007 අප්‍රේල් 07 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ දෙන ලද උපදෙස් වලට පටහැනිව එකතුව රු. මිලියන 3.55 ක දීමනා ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට ගෙවා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය හා සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත ප්‍රතිපාදනය, සමාලෝචිත වර්ෂය තුළදී අරමුදල් උපයෝජනය හා 2014 දෙසැම්බර් 31 දින දක්වා සමුච්චිත උපයෝජනය පිළිබඳ සැලකිය යුතු සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ සිදුකළ වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2014 වර්ෂය තුළ | | 2014 දෙසැම්බර් 31 දිනට | |
| | ජපන් යෙන් මිලියන | රු. මිලියන | රු. මිලියන | ජපන්යෙන් මිලියන | රු. මිලියන | ජපන්යෙන් මිලියන | රු. මිලියන |
| ජඅසනි | 12,381 | 20,913 | 227.72 | 203.61 | 221.79 | 208.53 | 227.15 |
| ශ්‍රී.ලං.ර | 3,751 | 6,336 | 45.94 | 42.32 | 46.09 | 49.26 | 53.66 |
| එකතුව | 16,132 | 27,249 | 273.66 | 245.93 | 267.88 | 257.79 | 280.81 |

## 3.2 භෞතික ප්‍රගතිය

-----------------

ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, පාලම්වල විස්තරාත්මක සැලසුම් සමාලෝචිත වර්ෂය තුළදී සිදු කර තිබුණි. පාලම් 10 ක පමණක් සිවිල් වැඩ ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 2014 දෙසැම්බර් 30 දින පවරා තිබුණි.

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනය

-------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) උපදේශන ගිවිසුමේ විෂය නිර්නේය අංක 03 කොන්දේසිය අනුව, සියළු සමීක්ෂණයන් හා විමර්ෂණයන් උපදේශක විසින් සිදු කළ යුතුය. කෙසේ වෙතත්, සමහර විමර්ෂණයන් හා සමීක්ෂණයන් බාහිර පාර්ශවයන් විසින් සිදු කර තිබුණු බව හා ව්‍යාපෘතිය විසින් රු. මිලියන 23.14 ක් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) උපදේශන ගිවිසුමේ පොදු කොන්දේසි අංක 6.5 (ඇ) අනුව, උපදේශක සේවාවේ සියළු ඉන්වොයිසි අවශ්‍ය උපකාරක ලියවිලි සමඟ ලබා දිය යුතු වුවත් සපයන ලද උපදේශන සේවා සඳහා අවශ්‍ය උපකාරක ලියවිලි නොමැතිව රු. මිලියන 29.97 ක් ගෙවා තිබුණි.

## 3.4 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සේවක මණ්ඩලය 62 ක් අනුමත කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට ව්‍යාපෘති කාර්යාලයේ කාර්ය මණ්ඩලය සාමාජික 31 කින් සමන්විත විය. කෙසේ වෙතත් ප්‍රධාන ඉංජිනේරු 02 ක්, ව්‍යාපෘති ඉංජිනේරු 07 ක් තාක්ෂණික ඉංජිනේරු 05 ක් ආදී වශයෙන් ඇබෑර්තු 40 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විට පුරප්පාඩුව පැවතුණි. තවද සහකාර ගණකාධිකාරින් 01 ක්, කළමනාකරණ සහකාරවරුන් 04 ක්, ආලෝක උපකරණ මෙහෙයුම්කරුවන් 03 ක් ඇතුලුව සේවකයින් 09 දෙනකු ව්‍යාපෘතිය විසින් සේවයේ යොදවා රු.මිලියන 4.09 ක් ගෙවා තිබුණු නමුත් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් එවැනි තනතුරු අනුමත කර නොතිබුණි.